L

30

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2016-09-07 |

පැමිණිලිකරුවන් : 01 ඒ.එච්.එම් පත්මසිරි බංඩාර මයා,
නො : 36, අක්කර 53,
අංගම්මන, පත්විල.

02 ඩී.ජේ.ජී.එස් බණ්ඩාර මයා,
නො : 128, දොඩම්වල,
රාජසිංහපුර, මුරුතලාව.

වගඋත්තරකරුවන් : 01. මේජර් ඩබ්.එස්.එල් රන්දෙණිය මයා,
අණදෙන නිලධාරී,
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව,
බලකා මූලස්ථානය, මහනුවර.

02. චන්ද්‍රරත්න පල්ලේගම මයා,
අධ්‍යක්ෂ ජනරාල්,
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව,
නො : 23, දුම්රියපොල පාර, බම්බලපිටිය.

පැමිණිලි අංකය : **HRC/K/376/15**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරුවන් දෙදෙනා විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තමන් මහනුවර මූලස්ථාන පොලිස් ස්ථානයට අනුයුක්තව සිවිල් ආරක්ෂක සේවයේ රාජකාරී කරමින් සිට 2009 වර්ෂයේදී සිවිල් ආරක්ෂක බලකාය මඟින් ලබාදුන් පිහිනුම් හා ජීවිතාරක්ෂක පාඨමාලාව සාර්ථකව හදාරා පසුව 2012 වර්ෂයේ දෙසැම්බර් මස ශ්‍රී ලංකා ජීවිතාරක්ෂක සංගමය මඟින් පවත්වන ලද විදේශීය ජීවිතාරක්ෂක රැකියාවක් සඳහා සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වී තමන් ඇතුළුව තම බලකායේ සිවිල් ආරක්ෂක භටයින් 16 දෙනකු තෝරාගත් බවයි.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 165, කිංසි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08.
සභාපති / தவிசாளர் / Chairman: 011-2696470
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2696470
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone: 94 - 11 - 2694925, 2685980, 2685981
ලේකම් / செயலாளர் / Secretary: 011-2689558
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2689558, 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

ඒ අනුව සිවිල් ආරක්ෂක බලකාය වෙත 2013.02.20 දින ජීවිතාරක්ෂක අංශ ප්‍රධානී මඟින් අධ්‍යක්ෂ ජනරාල්තුමා වෙත වසර දෙකක් සඳහා විදේශගත වීමට විදෙස් නිවාඩු අයදුම්කරන ලද බවත්, ඉන් පසුව 2013.03.21 දින ජීවිතාරක්ෂක අංශ ප්‍රධානී විසින් තම විදේශ නිවාඩු ඉල්ලුම්පත ක්‍රීඩා අධ්‍යක්ෂතුමා වෙත යොමුකර ඇති බවත් සඳහන් කර ඇත. ඒ සමඟ 2012.11.20 වන දින තමන් තෝරා ගැනීම සම්බන්ධයෙන් එවකට සිටි අධ්‍යක්ෂ රියඅද්මිරාල් ආනන්ද පීරිස් මහතා දැනුවත් කර ඇති බවත් දන්වා පැමිණිල්ලෙන් දක්වා ඇත. ඉන් පසුව 2013.04.17 වන දින ක්‍රීඩා අධ්‍යක්ෂතුමා මඟින් මධ්‍යම බලකා අණදෙන නිලධාරී වෙත තම නිවාඩු ඉල්ලුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කර ඇති බවත්, තමන් දෙදෙනා ඇතුළුව නිලධාරීන් 16 දෙනකු විදේශගත වූ බවත් තම බලකායේ මධ්‍යම පළාත් අණදෙන නිලධාරී දැනුවත් කර තොරතුරු පොතේ පිටවීම සටහන් යොදා විදේශගත වූ බවත් සඳහන් කර ඇත.

වසර දෙකක සේවා කාලයෙන් පසු නැවත තමන් ඇතුළු නිලධාරීන් 2015.03.04 දින ලංකාවට පැමිණි පසු රාජකාරී සඳහා වාර්තා කිරීමට මධ්‍යම පළාත්භාර නිලධාරී වෙත ඉදිරිපත් වුවද නැවත තමන් වෙත රාජකාරී ලබාදිය නොහැකි බව දන්වා සිටි බවත්, ඒ පිළිබඳව විමසූ අවස්ථාවේ අණදෙන නිලධාරී විසින් නිවාඩු ලිපිය නිර්දේශ කර අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකර නොමැති බවට ප්‍රකාශ කරන ලද බවත් සඳහන් කර ඇත.

ඒ අනුව තම දෙදෙනාගේ නිවාඩු ඉල්ලුම්පත්‍ර 2013.04.17 දින මධ්‍යම පළාත් අණදෙන නිලධාරී වෙත ලැබෙන විට තම දෙදෙනා විදේශගත වී සිටි බවත්, ඔහු හිතාමතාම තමන් අපහසුතාවයට පත් කරවීමක් සිදුකර ඇති අතර තම දෙදෙනා ඇතුළුව විදේශගත වූ අනෙක් 14 දෙනා දැනට ඔවුන්ගේ බලකාවල රාජකාරීවල නිරත වී සිටින බවත් තමන්ගේ පමණක් රැකියාව අහිමි කිරීමෙන් ආර්ථික වශයෙන් හා මානසික වශයෙන් පහළ තත්වයකට පත්වී ඇති බැවින් සියළු කරුණු අවධානයට ගෙන නැවත රැකියාව ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින බවත් සඳහන් කර ඇත.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-

පළමු වගඋත්තර පාර්ශවීය මහනුවර බලකා මූලස්ථානයේ අණදෙන නිලධාරී විසින් වාර්තාවක් යොමු කරමින් සඳහන් කර ඇත්තේ, අදාළ පැමිණිලිකරුවන් දෙදෙනා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට බැඳී මහනුවර බලකා මූලස්ථානයේ සේවයේ යෙදී සිටි අවස්ථාවේදී සිවිල් ආරක්ෂක මූලස්ථානයේ පිහිණුම් සංචිතයට ඇතුළත් වී පුහුණුවීම් කටයුතු කරගෙන ගිය බවත්, මෙම කාලය තුළ ඉහත දෙදෙනා විදේශගත වීමට තීරණය කර ඇති බවත් ඒ පිළිබඳව විදේශගත වීම සඳහා පිළිගත හැකි සියළු ලිපිලේඛන ජීවිතාරක්ෂක ක්‍රීඩා අංශයේ ප්‍රධානී වෙත භාර දී එමගින් වැඩබලන ක්‍රීඩා අධ්‍යක්ෂ වෙත නිවාඩු ලබා දීම නිර්දේශ කර අයදුම්පත් යොමු කර ඇති බවත් ඒ පිළිබඳව තමා වෙත කිසිදු දැනුම්දීමක් කර නොමැති බවත්ය. එකී ලිපිය යොමු කර ඇත්තේ 2013.03.14 දින වන අතර නිවාඩු අයදුම්පත් භාරදී පැමිණිලිකරුවන් විදේශගත වී ඇති බවත් පසුව 2013.04.17 දින අත්සන් කර නිවාඩු නිර්දේශ ලබා දීමේ ලිපිය 2013.05.14 දින තමා වෙත ලැබුනු බවත් එකී ලිපියේ වසර දෙකක කාලයකට විදෙස් නිවාඩු

නිර්දේශ කර එවන ලෙස සඳහන්ව තිබූ නමුත් විදේශගතවීමට පෙර අදාළ නිවාඩු බලකා අණදෙන නිලධාරීන්ගෙන් ඉල්ලුම් කර නිර්දේශ ලබා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත අනුමත කිරීමට යැවීමෙන් පසු විදේශගතවීමට අවසර ලබාදෙන බවත් එසේ වුවද එම ක්‍රමවේදය අනුගමනය නොකර පැමිණිලිකරුවන් දෙදෙනා විදේශගත වී ඇති බැවින් එම ලිපිය අනුව තමා සිවිල් ආරක්ෂක මූලස්ථානයෙන් උපදෙස් ඉල්වූ බවත් මෙම නිවාඩු නිර්දේශ ලිපිය තමා වෙත ලැබෙන විටත් පැමිණිලිකරුවන් විදේශගත වී ඇති බවත් සඳහන් කර ඇත.

එසේම පැමිණිල්ලේ සඳහන් වන පරිදි විදෙස්ගතවීම සම්බන්ධයෙන් තමාව දැනුවත් කර නොමැති බවත්, ක්‍රියාපටිපාටියෙන් බැහැරව පැමිණිලිකරුවන් දෙදෙනා විදෙස් ගතවී ඇති අතර නැවත පැමිණිලිකරුවන් 2015.03.04 දින ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසු රාජකාරී රපෝර්තු කිරීම සඳහා තමා වෙතින් ඉල්ලීමක් කරන ලද නමුත් ක්‍රමවේදයට පටහැනිව පැමිණිලිකරුවන් ක්‍රියාකර ඇති බවත් සඳහන් කර ඇත. නමුත් සානුකම්පිතව සලකා බලා නැවත සේවයේ පිහිටුවීමට අවශ්‍ය ලියවිලි සකස් කර සිවිල් ආරක්ෂක මූලස්ථානය වෙත යොමුකළ බවත් මහනුවර බලකායේ රාජකාරී කරන සිවිල් ආරක්ෂක භටයින් විශාල ප්‍රමාණයක් නීත්‍යානුකූල ක්‍රමවේදයට විදෙස්ගත වී ලංකාවට පැමිණ නැවත සේවය ඉල්ලා තිබූ අතර එම සියළු අයහට අදාළ ක්‍රමවේදය අනුව කටයුතු කර ඇති බවත්, විදෙස් ගතවීමට කරන ලද ඉල්ලීම තමා කිසිවිටෙකත් ප්‍රතික්ෂේප නොකරන ලද බවත් සඳහන් කර ඇත.

**2 වන වගඋත්තර පාර්ශවීය අධ්‍යක්ෂ ජනරාල් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව** විසින් වාර්තාවක් ලබා දෙමින් සඳහන් කර ඇත්තේ පැමිණිලිකරුවන් දෙදෙනා මහනුවර බලකා මූලස්ථානයේ සේවයේ යෙදී සිටියදී සිවිල් ආරක්ෂක පිහිණුම් හා ජීවිතාරක්ෂක ක්‍රීඩා අංශයට ඇතුළත් වී එම අංශයේ පුහුණුවීම් කටයුතු කර ඇති බවයි.

මොවුන් විසින් විදෙස් රැකියාවන් සඳහා පිටත්වීමට තීරණය කර වැටුප් රහිත විදෙස් නිවාඩු සඳහා මහනුවර බලකා අණදෙන නිලධාරී නිර්දේශය හා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියෙන් තොරව ක්‍රීඩා අංශ ප්‍රධානී හා වැඩබලන ක්‍රීඩා අධ්‍යක්ෂ මඟින් පමණක් නිවාඩු නිර්දේශ කර ගැනීමෙන් අනතුරුව 2013.02.25 හා 2013.03.14 දින විදේශගත වී ඇති බවත්,

විදේශ රැකියාව අවසන් කර 2015.03.04 දින ලංකාවට පැමිණි පැමිණිලි පාර්ශවයන් අණදෙන නිලධාරීගේ නිර්දේශ සමඟින් අභියාචනා ඉදිරිපත් කරමින් නැවත රාජකාරී වාර්තා කිරීමට ඉල්ලුම් කර ඇති නමුත් පැමිණිලිකරුවන් විසින් නීත්‍යානුකූලව විදේශ නිවාඩු අනුමත කර ගැනීමකින් තොරව විදේශගත වී ඇති හෙයින් වසර 02 කට වැඩි කාලයක් නිවාඩු නොලබා නොපැමිණි අයවලුන් සේ සලකා, දෙපාර්තමේන්තු නීතිරීති වලට අනුකූලව දින 30 කට අධික කාලයක් නිවාඩු නොලබා නොපැමිණි අයවළුන් සේවයෙන් ඉවත් කිරීමට සිදුවන බැවින් මොවුන්ට නැවත රාජකාරී ලබා දීමට අනුමත කිරීමට හැකියාවක් නොමැති බව කණගාටුවෙන් දන්වන බවත් සඳහන් කර ඇත.

මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු :-

1. පැමිණිලිකරුවන් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සිවිල් ආරක්ෂක භටයින් ලෙස සේවයට එක්වී මහනුවර මූලස්ථාන පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරී කර ඇති අතර සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ පිහිණුම් හා ජීවිත ආරක්ෂක අංශය යටතේ සේවය කර ඇත.

2. පැමිණිලිකරුවන් පිහිණුම් හා ජීවිත ආරක්ෂක අංශයට අයත් නිලධාරීන් දෙදෙනකු බැවින් ඔවුන් හා සම්බන්ධ සියළු පරිපාලන රාජකාරී කටයුතු අධීක්ෂණය හා පරිපාලනය පිහිණුම් ජීවිතාරක්ෂක ක්‍රීඩා අධ්‍යක්ෂ හා අංශ ප්‍රධානී යටතට අයත් වේ.

3. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ පිහිණුම් හා ජීවිතාරක්ෂක අංශයට අයත් සිවිල් ආරක්ෂක භටයින් 16 දෙනකු වසර 02 ක කාලයක් සඳහා පිහිණුම් හා ජීවිතාරක්ෂක අංශයේ විදේශ රැකියාවන් සඳහා තෝරාගැනීමෙන් පසු ඔවුන්ට ඒ සඳහා විදේශගතවීමට අවශ්‍ය අනුමැතිය ලැබීම අනුව 2013 වර්ෂයේ විදේශගත වී ඇත.

4. පැමිණිලිකරුවන් දෙදෙනා අදාළ වසර 02 ක කාලය සඳහා වැටුප් රහිත නිවාඩු අනුමත කර ගැනීම සඳහා පිහිණුම් හා ජීවිතාරක්ෂක ක්‍රීඩා අංශ ප්‍රධානී මඟින් අධ්‍යක්ෂ ජනරාල් වෙත 2013.02.20 හා 2013.03.13 දිනැති ලිපි මඟින් ඉල්ලීම් කර ඇති අතර ක්‍රීඩා අංශ ප්‍රධානී විසින් අදාළ ඉල්ලීම නිර්දේශ කර සුදුසු කටයුතු සඳහා වැඩබලන ක්‍රීඩා අධ්‍යක්ෂ වෙත 2013.03.21 දිනැතිව ඉදිරිපත් කර ඇත.

5. වැඩබලන ක්‍රීඩා අධ්‍යක්ෂ විසින් පැමිණිලිකරුවන් දෙදෙනා ඇතුළු අනෙකුත් ඉල්ලුම්කරුවන්ගේ වැටුප් රහිත වසර 02 ක නිවාඩු ඉල්ලුම් නිර්දේශ කර අදාළ පළාත් අණදෙන නිලධාරිගේ නිර්දේශ සඳහා 2013.04.17 දිනැතිව යොමුකර ඇත.

6. වැඩබලන ක්‍රීඩා අධ්‍යක්ෂකගේ 2013.04.17 දිනැතිව පළාත් භාර අණදෙන නිලධාරීන් වෙත ලබාදෙන ලෙස දන්වා ඇති නිර්දේශය අදාළ පළාත් භාර නිලධාරීන් පහත පරිදි ලබා දී ඇති බව තහවුරු වේ.

| පළාත් බලකා අණදෙන නිලධාරී | නිර්දේශ ලබාදෙන ලද සි.ආ භටයින්ගේ නම් හා අංක | නිර්දේශ ලබා දී ඇති ලිපියේ දිනය | අධ්‍යක්ෂ ජනරාල් විසින් නිවාඩු අනුමත කර ඇති දිනය |
|---|---|---|---|
| අනුරාධපුරය | 1. සි.අ.ටි 704620 සී.පී සෙනවිරත්න<br>2. සි.අ.ටි 89292 බී.එල්.ඩී අසංක<br>3. සි.අ.ටි 84570 ඩබ්.ඒ.එස් දිල්රුක්ෂ | 2013.05.21 | 2013.06.26 |

| | | | |
|---|---|---|---|
| ත්‍රිකුණාමලය | 1. සි.අ.භ.ට 73108 ජේ.ජී.එස් බණ්ඩාර<br>2. සි.අ.භ.ට 62077 කේ.ජේ ඉද්දමල්ගොඩ<br>3. සි.අ.භ.ට 65338 ජේ.ඒ.වයි බණ්ඩාර<br>4. සි.අ.භ.ට 65878 ඒ.පී.යූ.එල් වික්‍රමසිංහ<br>5. සි.අ.භ.ට 88955 එච්.එම් ප්‍රියදර්ශන<br>6. සි.අ.භ.ට 39179 පී.ඒ.පි රූපසිංහ<br>7. සි.අ.භ.ට 52560 ඩබ්.ඩී.කේ.ආර් සම්පත්<br>8. සි.අ.භ.ට 88954 ලක්මාල් සඳරුවන් | | |
| මහනුවර | 1. සි.අ.භ.ට 76023 ඒ.එච්.එම්.පී බණ්ඩාර<br>2. සි.අ.භ.ට 52083 ඩී.ඒ.ජී.එස් බණ්ඩාර | නිර්දේශ ලබා දී නොමැත. | |

7. අදාළ වසර 2 ක කාල සීමාව සඳහා වසර 2 ක වැටුප් රහිත නිවාඩු අනුමත කිරීම 2013.02.24 හා 2013.03.13 දින සිට වසර 02 ක කාලයක් සඳහා සිදුවී ඇති අතර අදාළ අනුමැතිය ලබා දී ඇත්තේ 2013.06.20 හා 2013.06.26 දිනවල බව පැහැදිලි වේ.

8. පැමිණිලිකරුවන් ඇතුළු සිවිල් ආරක්ෂක භටයින් විදේශගත වී ඇත්තේ 2013 වර්ෂයේ පෙබරවාරි හා මාර්තු මාසවල වන අතර අදාළ විදේශගත වීමෙන් පසු වසර 2ක වැටුප් රහිත නිවාඩු අනුමත කිරීම සඳහා නිර්දේශ ලබා ගැනීමට පළාත් භාර අණදෙන නිලධාරීන් වෙත 2013.04.17 යොමු කිරීමෙන් පසු ඔවුන්ගේ නිර්දේශ අනුව අනුමැතිය අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබා දී ඇති බව තහවුරු වේ.

9. වසර 02ක සේවා කාලයක් සඳහා පැමිණිලිකරුවන් දෙදෙනා ඇතුළු සිවිල් ආරක්ෂක භටයින් විදේශගතවීමෙන් පසු වසර 02 ක වැටුප් රහිත නිවාඩු සඳහා නිර්දේශ අනුරාධපුර හා ත්‍රිකුණාමල පළාත් බලකා අණදෙන නිලධාරීන් විසින් නිර්දේශ කර ඇති නමුත් මධ්‍යම පළාත් අණදෙන නිලධාරී විසින් නිර්දේශ ලබා දී නොමැත.

10. 2015.08.26 දින මෙම කොමිෂන් සභාවේ පැවැති පරීක්ෂණයේදී මධ්‍යම පළාත් කලාප අණදෙන නිලධාරි විසින් ප්‍රකාශ කර ඇත්තේ පැමිණිලිකරුවන් වසර 02 ක නිවාඩු අනුමත කර ගැනීමකින් තොරව විදේශගත වී ඇති බැවින් ඔවුන්ගේ නිවාඩු නිර්දේශ කිරීම ගැටළු සහගත වූ බැවින් ඒ පිළිබඳව උපදෙස් පතා වැඩබලන ක්‍රීඩා අධ්‍යක්ෂ වෙත ලිපියක් ඉදිරිපත් කර ඇති බවයි. උක්ත ලිපිය පිළිබඳ සැකයක් මතු වූ බැවින් කොමිෂන් සභාව විසින් අධ්‍යක්ෂ පිරිස් හා පාලන වෙත යොමුගත 2015.09.09 දිනැති ලිපියෙන් එවැනි ලිපියක් ලැබී තිබේද යන්න පිළිබඳව විමසීමේදී එවැනි ලිපියක් ලැබී නොමැති බව දන්වා ඇත. ඒ අනුව ලිපියක් යොමු කර ඇති බවට පිළිගත නොහැකි අතර එවැනි ව්‍යාජ ලිපියක් පසුව නිකුත් කර තිබේද යන්න දෙපාර්තමේන්තුව මඟින් සොයා බැලිය යුතු වේ.

11. අදාළ පැමිණිලිකරුවන් දෙදෙනා ඇතුළු විදේශගත වූ අනෙකුත් සිවිල් ආරක්ෂක භටයින් සඳහා වසර 2 ක වැටුප් රහිත නිවාඩු ඔවුන් විදේශගත වීමෙන් පසු අනෙකුත් අදාළ කලාප භාර අණදෙන නිලධාරීන් විසින් නිර්දේශ කර තිබියදී මධ්‍යම කලාප භාර අණදෙන නිලධාරී විසින් අදාළ නිවාඩු නිර්දේශ නොකිරීම මඟින් පැමිණිලිකරුවන්ට අගතියක් සිදුවී ඇති බවට තහවුරු වේ.

12. පැමිණිල්ලට අදාළව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති වාර්තාව මඟින්ද පැමිණිලිකරුවන් විදේශගත වූ වසර 02 ක කාල සීමාව සඳහා වැටුප් රහිත නිවාඩු අනුමත කර ගැනීමකින් තොරව විදේශගත වී ඇති බැවින් ඔවුන් වසර 2 කට වැඩි කාලයක් නිවාඩු නොලබා නොපැමිණි අයවලුන් සේ සලකනු ලබන බවත් දෙපාර්තමේන්තු නීතිරීතිවලට අනුව දින 30 කට අධික කාලයක් නිවාඩු නොලබා නොපැමිණි අයවලුන් සේවයෙන් ඉවත් කිරීමට සිදුවන බැවින් පැමිණිලිකරුවන් නැවත රාජකාරී ලබා දීම නොහැකි බවත් සඳහන් කළද පැමිණිලිකරුවන් දෙදෙනා හැර අනෙකුත් සිවිල් ආරක්ෂක භටයින්ද නිවාඩු අනුමත කිරීමට පෙර විදේශගත වී ඇති නමුත් ඔවුන්ට නැවත සේවය ලබා දී ඇති බව තහවුරු වේ.

13. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වාර්තාවේ සඳහන් වන පරිදි දෙපාර්තමේන්තු නීතිරීති අනුව දින 30 කට වැඩි කාලයක් නිවාඩු නොලබා නොපැමිණි අයවලුන් සේවයෙන් ඉවත් කිරීමට සිදුවන බව දන්වා ඇතත් පැමිණිලිකරුවන් දෙදෙනා විදේශගත වී මේ වන විට වසර 2½ ක් පමණ ගත වී ඇති නමුත් ඔවුන්ගේ සේවය අවසන් කිරීම පිළිබඳ ඔවුන් වෙත දැනුම්දීමක් කර නොමැති අතර ඔවුන් භාරයේ ඇති දෙපාර්තමේන්තුවට අයත් භාණ්ඩ භාරගෙනද නොමැත. ඒ අනුව ඔවුන් මේ වන විටත් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට අයත් නිලධාරීන් වන නමුත් රාජකාරී කිරීමට අවස්ථාව අහිමි කර ඇති බව තහවුරු වේ.

14. පැමිණිල්ලේ පරීක්ෂණ කටයුතුවලට අදාළව අධ්‍යක්ෂ (පිරිස් හා පාලන) ගේ 2015.10.02 දිනැතිව කොමිෂන් සභාව වෙත යොමුගත ලිපිය මඟින්ද පැමිණිලිකරුවන් හැර අනෙකුත් සිවිල් ආරක්ෂක භටයින් වසර 2 ක වැටුප් රහිත නිවාඩු අනුමත කරගෙන විදේශගතවී ඇති බව සඳහන් කළද ඉදිරිපත් කර ඇති ලේඛන අනුව පැහැදිලිව නිරීක්ෂණය වන්නේ ඔවුන් සියළු දෙනාටම වසර 02 ක වැටුප් රහිත නිවාඩු අනුමත වී ඇත්තේ විදේශගත වීමෙන් මාස 03කට පමණ පසුව බවයි. ඒ අනුව වගඋත්තර පාර්ශවය විසින් සාවද්‍ය කරුණු ඉදිරිපත් කර ඇති බව පැහැදිලි වේ.

15. පැමිණිලිකරුවන් වසර 2 ක විදේශ රැකියාව අවසන් කර පැමිණීමෙන් පසු නැවත රාජකාරී වාර්තා කිරීමට අවසර ලබාදෙන ලෙස ඉල්ලා පළමු වගඋත්තර පාර්ශවීය සිවිල් ආරක්ෂක බලකා මධ්‍යම අණදෙන නිලධාරී වෙත ඉදිරිපත් කර ඇති ඉල්ලීම ඔහුගේ 2015.04.10 දිනැති ලිපියෙන් අධ්‍යක්ෂ (පිරිස් හා පාලන) වෙත යොමුකර ඇති අතර ඔහු විසින් එය අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකර ඇති නමුත් වසර 2 ක නිවාඩු අනුමත කර ගැනීමකින් තොරව විදේශගත වී ඇති බැවින් නැවත රාජකාරී ලබා දීම අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කර නොමැති බවද අධ්‍යක්ෂ (පිරිස් හා පාලනගේ) වාර්තාවේ සඳහන් කර ඇත.

16. වසර 2 ක කාලයකට විදේශ රැකියාවක් සඳහා විදේශගත වූ සිවිල් ආරක්ෂක භටයින් සඳහා අනුරාධපුර හා ත්‍රිකුණාමලය කලාප භාර අණදෙන නිලධාරින් විසින් ඔවුන් හට විදේශගත වූ පසුව නිවාඩු නිර්දේශ කර තිබියදී 1 වන වගඋත්තරකාර මධ්‍යම පළාත් අණදෙන නිලධාරී මේජර් රන්දෙණිය මහතා විසින් පමණක් වසර 2 ක වැටුප රහිත නිවාඩු නිර්දේශ නොකිරීම අත්තනෝමතික ක්‍රියා මාර්ගයක් බව නිරීක්ෂණය වේ.

**නිරීක්ෂණ හා නිගමනය :-**

වසර 02ක විදේශ රැකියාවක් සඳහා විදේශ ගතවී ඇති පැමිණිලිකරුවන් ඇතුළු සියළු ආරක්ෂක භටයින් විදේශගතවීමට ප්‍රථම වසර 2ක කාලයක් සඳහා වැටුප් රහිත නිවාඩු අනුමත කර ගැනීමට පෙර විදේශගත වී ඇති නමුත්, පැමිණිලිකරුවන්ගේ හැර අනෙකුත් භටයින්ගේ නිවාඩු ඉන් මාස 3 කට පමණ පසු අදාළ පළාත්භාර අණදෙන නිලධාරීන් විසින් නිර්දේශ කිරීම හේතුවෙන් ඔවුන් වෙත නැවත රාජකාරී ලැබී ඇති නමුත් පැමිණිලිකරුවන් දෙදෙනාගේ නිවාඩු පළාත් භාර අණදෙන නිලධාරී විසින් නිර්දේශ නොකිරීම හේතුවෙන් ඔවුන්ට සේවය අහිමි වී ඇති අතර වගඋත්තර පාර්ශවය පැමිණිලිකරුවන් දෙදෙනා කෙරෙහි කටයුතු කිරීමේදී නීතිය ඉදිරියේ සමාන ලෙස සැලකිලි ලැබීමට ඇති මූලික අයිතිවාසිකම උල්ලංඝනය වන අයුරින් කටයුතු කර වෙනස්කමකට භාජනය කර ඇති බව නිරීක්ෂණය වේ.

මුල් අවස්ථාවේදී පළාත් භාර අණදෙන නිලධාරීවරයාගේ නිර්දේශය නොතිබුනද 2 වන වරට 2015.04.10 දිනැතිව අදාල නිර්දේශය ලබා දී තිබියදී නැවත රාජකාරී ලබා දීමට ක්‍රියා නොකිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පැමිණිලිකරුවන්ට සිදුකර ඇති බලවත් අගතියක් වන බවද නිරීක්ෂණය වේ.

මෙම කරුණු අනුව ඉහත වගඋත්තර පාර්ශවය විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කොට දී ඇති නීතිය ඉදිරියේ සමානාත්මතාවයට ඇති මූලික අයිතිවාසිකම පැමිණිලිකරුවන් සම්බන්ධයෙන් උල්ලංඝනය කර ඇති බවට නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

01. දැනට සිවිල් ආරක්ෂක භටයින් 2015.04.23 සිට ස්ථිර සේවයේ පිහිටුවා ඇති බැවින් එදින සිට බලපැවැත්වෙන පරිදි පැමිණිලිකරුවන් දෙදෙනාද ස්ථිර සේවයේ පිහිටුවා රාජකාරී කිරීමට අවස්ථාව ලබා දීමටත්,

02. පැමිණිලිකරුවන්ගේ වසර 2 ක වැටුප් රහිත නිවාඩු අවසන් වන දින සිට බලපැවැත්වෙන පරිදි අඛණ්ඩ සේවා කාලය ලබා දීමටත්,

03. පැමිණිලිකරුවන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම හා මාස 06 ක කාලයක් රැකියාව අහිමි වීම වෙනුවෙන් රු. 1,95,549/-ක් බැගින් වූ වන්දි මුදලක් පැමිණිලිකරුවන් වෙත ගෙවීමටත් වගඋත්තර පාර්ශවය විසින් පියවර ගත යුතු බවට මෙයින් දන්වා සිටිමු.

තවද,

04. පැමිණිලිකරුවන්ගේ වසර 2 ක වැටුප් රහිත නිවාඩු නිර්දේශ නොකිරීම සම්බන්ධයෙන් අත්තනෝමතික ලෙස කටයුතු කර ඇති පළමු වගඋත්තර පාර්ශවීය මධ්‍යම පළාත් භාර අණදෙන නිලධාරී, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් විනය පියවර ගැනීම සඳහා කටයුතු කිරීමට සහ,

05. පැමිණිලිකරුවන් හට නැවත රාජකාරී ලබා නොදීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා ලේකම්, ආරක්ෂක අමාත්‍යංශය විසින් පියවර ගත යුතු බවටද මෙයින් නිර්දේශ කරමු.

2016.10.31 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොලබන බවද වැඩිදුරටත් දන්වමු.

| | |
|---|---|
| සභාපති, | කොමසාරිස්, |
| ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව. | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව. |

**Dr. N. D. Udagama**
**Chairperson**
**Human Rights Commission of Sri Lanka**

පිටපත :- 1. ලේකම්, - නිර්දේශයේ 04 හා 05 පරිදි කටයුතු කිරීමට
ආරක්ෂක අමාත්‍යංශය,
15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03.

2. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රාදේශීය කාර්යාලය,
මහනුවර